# පෙරවදන

ශ්‍රී ලංකාව බහු ආගමික හා බහු ජනවාර්ගික රටකි. මෙම බහුත්වය තුළ විවිධ පාර්ශවයන් අතර මත වෙනස්කම් ඇතිවීම වැළැක්විය හැක්කක් නොවේ. නමුත් රටේ සාමය පවත්වාගෙන යන්නට නම් මෙම මත වෙනස්කම් එකිනෙකා අතර වෛරය හා ක්‍රෝධය ඇතිකර ගැනීමේ සාධකයක් බවට පත්කර ගත නොයුතුය. මෙවන් මත වෙනස්කම් ඇතිවන අවස්ථාවන්හි මෙම පාර්ශවයන් අතර අන්‍යෝන්‍ය අවබෝධය තුළින් ප්‍රශ්න සාකච්ඡා කිරීමට කටයුතු කිරීම අත්‍යාවශ්‍ය වන්නේය.

ආගමික හා වාර්ගික කොටස් අතරේ නිරතුරුව මතුවන ප්‍රශ්න විග්‍රහ කිරීම පදනම් කරගෙන සකස්කර ඇති මෙම 'සමාජ සංවාද' ලිපි පෙළ අප සැමගේ අවධානයට යොමු විය යුතු වැදගත් ලිපි පෙළක් ලෙස දකින්නෙමි. සමාජ පාර්ශවයන් අතරේ අර්ථවත් සංවාදයක් සඳහා වූ සාමකාමී දොරටු විවෘත කොට අපගේ ප්‍රශ්න අප අතරේම විසඳා ගැනීමේ මාවතට යොමු කරන වැදගත් ලිපි පෙළක් ලෙස ද මෙය දකින්නෙමි.

මෙහි අන්තර්ගත වැදගත්, යථාර්ථවාදී හා තර්කානුකූල අදහස් අගයකොට සලකමි. උද්වේගය පසෙකලා ශ්‍රී ලාංකිකයින් වශයෙන් අපගේ සාම්ප්‍රදායික බැඳියාවන් හා සහෝදරත්වය ආරක්ෂා කර ගනිමින් අප අතරේ ඇති මත වෙනස්කම් විසඳා ගැනීමට මෙමගින් යහ ආරම්භයක් ඇති කර දී ඇති බව දකින්නට ඇත.

අපගේ මතය හා සමාකාර අයුරින් අන් අය මත දැරිය යුතු යැයි සිතීම සදාචාර සම්පන්න යහ පිළිවෙතක් නොවේ. මා දරණ මතයට පටහැනි මතයක් දැරීමට අන් අයට අයිතියක් ඇති බව රටේ මූලික නීතිය වූ රාජ්‍ය ව්‍යවස්ථාවෙන් ද සහතික කොට ඇත. එහෙයින් සංවාද තුළින් සම්මුතියක් ඇති කර ගැනීමට කටයුතු කරමු. එසේ කිරීමට දුෂ්කරතාවන් ඇති වන අවස්ථාවන්හි දී මගේ මතයට පටහැනි මතයක් දැරීමට අනිකාට පූර්ණ නිදහස හා අයිතියක් ඇතැයි යන මූලික මානව අයිතිවාසිකම් සිද්ධාන්තය පිළිගෙන සාමකාමීව කටයුතු කරන්නට කැප වෙමු. කෙසේ නමුත් මෙම ලිපි පෙළ මගින් අප සැමට නව චින්තන ප්‍රවේශයක් ලබා දී ඇතැයි යන්න පිළිගැනීමට කිසිම අපහසුතාවක් නොමැති බව මාගේ පිළිගැනීමයි.

සමාජ ප්‍රශ්න විසඳා ගැනීමට  උචිතම පිළිවෙත සාමකාමී සංවාද බව මෙම ලිපි පෙළ අපට දැඩි ලෙස අවධාරණය කර සිටී.

ජයං වෙරං පසවති<br>
දුක්ඛං සෙති පරාජිතෝ<br>
උපසන්තෝ සුඛං සෙති<br>
හිත්වා ජය පරාජයං (ධම්ම පදය)

අර්ථය: ජය ගන්නා පුද්ගලයා අනුන්ගේ වෛරය තමා වෙත යොමු කරවයි. පැරදුනු පුද්ගලයා දුකසේ වෙසෙයි. ජය පරාජය දෙකම අත්හැර සංසිඳීමට පත් පුද්ගලයා සුවසේ වාසය කරයි.

ශාස්ත්‍රපති පණ්ඩිත පූජ්‍ය ගලගම ධම්මරංසි හිමිපාණෝ<br>
විහාරාධිපති<br>
ශ්‍රී හත්බෝධි විහාරය<br>
කිරුළ පාර - කොළඹ 05.

# හැඳින්වීම

'සාමය හා සංහිඳියාව වෙත යොමු වූ සමාජ සංවාද' ලිපි පෙළ සකස් කිරීමේ දී අප ප්‍රධාන වශයෙන්ම අවධානය යොමු කළේ විවිධත්වයකින් අලංකෘත වූ ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ සුහදත්වය හා සාමූහිකත්වය ගොඩ නැගීමේ උතුම් අරමුණ කෙරෙහිය.

විවිධ ජන වාර්ගික, ආගමික සහ සංස්කෘතික උරුමයන්ගෙන් පෝෂිත වූ අප සමාජය, සාමයේ හා සංහිඳියාවේ මාවතේ අඛණ්ඩව ගමන් කිරීමට නම් සියලු පාර්ශවයන් අතරේ අන්‍යෝන්‍ය අවබෝධය ස්ථාපිත කිරීම අත්‍යාවශ්‍ය සාධකයක් ව පවතී. අන්‍යෝන්‍ය අවබෝධය නොමැති විට එකිනෙකා පිළිබඳ සැකය, අවිශ්වාසය, බිය වැනි හානිකර ප්‍රවනතාවන් ගොඩ නැගෙන්නට ඇති ඉඩකඩ බහුලය. කිසිඳු දහමක් මෙවන් වියවුල් සමාජ තත්ත්වයන් අනුමත නොකරයි. එබැවින් සංවාදී සමාජ සම්බන්ධතාවක් මගින් අන්‍යෝන්‍ය අවබෝධය ස්ථාපිත කොට සමාජ සාමූහිකත්වය ගොඩ නැගීම යුගයේ අවශ්‍යතාවයක් ව පවතී.

එක් එක් දහම් හි වත් පිළිවෙත්, චර්යාවන් මෙන්ම සංස්කෘතික පැතිකඩයන් පිළිබඳව අප සියලු දෙනාම අවබෝධයක් ලබා ගැනීමේ ප්‍රයත්නයක නිරත වීම අත්‍යවශ්‍ය කරුණක් ලෙස දකින්නෙමු. එමෙන්ම සමාජ සංහිඳියාව ශක්තිමත් පදනමකින් ගොඩ නගන්නට නම් සෑම දහමක්ම එම දහමේ වැදගත් ඉගැන්වීම් පිළිබඳව අන් ආගමිකයින් දැනුවත් කිරීම ද වැදගත් වේ.

ඉස්ලාම් දහම මෙන්ම මුස්ලිම් සමාජය පිළිබඳව ද විවිධ වැරදි මත ඇති වී තිබෙන බව අපි ඉතා නිහතමානීව පිළිගන්නෙමු. එම වැරදි මතයන් ගැන කරුණු පහදා දී සත්‍ය තත්ත්වය අවබෝධ කර දීමේ වගකීම අප විසින් අතපසු කොට ඇති බව ද පිළිගන්නෙමු. ප්‍රමාද වී හෝ එම භාරධූර කාර්ය පිළිබඳව යමක් කිරීමට අවස්ථාවක් ලැබීම භාග්‍යයක් කොට සලකන්නෙමු.

මෙය සාධනීය සංවාදයක් සඳහා වූ දොරටු විවෘත කිරීමක් පදනම් කරගත් ලිපි පෙළක් හෙයින් මෙහි අන්තර්ගතයේ ඇති කරුණු පිළිබඳව ඔබගේ අවංක අදහස් දැක්වීම් අපි ඉතා අගය කොට සලකන්නෙමු.

විසංවාදී නොවී සංවාදී සමාජයක් තුළ සියලු කරුණු සාමකාමීව විසඳා ගැනීමට අධිෂ්ඨානශීලීව ක්‍රියා කරන්නට ලක් මවගේ සියලු දරුවන් වන අපි එකට අත්වැල් බැඳ ගනිමු. සෞභාග්‍යයෙන් පිරි සංවර්ධිත ශ්‍රී ලංකාවක් ගොඩ නගන්නට අපගේ පූර්ණ දායකත්වය ලබා දෙමු.


**සැකසුම**

මව්ලවි මුර්ෂිඩ් මුලෆ්ෆර්
මව්ලවි මාහිර් රම්ඩීන්
මව්ලවි ඉර්ෂාද් හිල්මි
මව්ලවි නූෘමාන් ඔමර්

සහෝදර මොහොමඩ් දහලන්
සහෝදර අයාස් සාලිහ්

ඊ-මේල්: teamunityhub@gmail.com

දුරකතන අංක: +94 783 330 004, +94 722 009 002

අන්තර්ජාල: www.unityhub.org

# අන්තර්ගතය


- සත්ව ඝාතනය හා මාංශ අනුභවය
- විශ්වීය බලපෑම
- දේශීය බලපෑම
    - දේශීය සමාජීය බලපෑම
    - දේශීය ආර්ථික බලපෑම
- පුද්ගල බලපෑම
    - සෞඛ්‍ය බලපෑම
    - පොදු සාධක
- ආගමික දැක්ම
    - බිලි පූජාව
    - අන්තවාදීත්වයෙන් තොර වූ බුදුන් වහන්සේගේ මධ්‍යස්ථ ක්‍රියා කලාපය
- ඉස්ලාමීය ඉගැන්වීම්
- හජ් උත්සවය හා ඉස්ලාමීය වත්පිළිවෙත්

**ප්‍රශ්නය**

**ඉස්ලාමය ඉතාමත්ම කාරුණික වූ දහමක් බව පවසති. එසේ තිබිය දී ඉස්ලාමීය පිළිවෙත් හා ආහාර සඳහා සතුන් මරන්නට කටයුතු කරන්නේ ඇයි? ඔබගේ සතුට වෙනුවෙන් සතුන් මැරීම සාධාරණ ද?**

## පැහැදිලි කිරීම

### සත්ව ඝාතනය හා මාංශ අනුභවය

මාංශ අනුභවය හා සතුන් කැපීම පිළිබඳ මාතෘකාව සාකච්ඡා කිරීමේ දී නිරායාසයෙන් ම බහුතරයකගේ ඇඟිල්ල දිගු වන්නේ ඉස්ලාමය හා මුස්ලිම්වරුන් වෙත බව අමුතුවෙන් කිව යුතු නොවේ. එහෙයින් පූර්ව නිගමනයන්, පාරම්පරික විශ්වාසයන් හා විචාරයෙන් තොර වූ පක්ෂපාතිත්වය ආදියෙන් මිදී විවෘත මනසකින් යුක්තව යථාර්ථය, විචාරය, බුද්ධිය හා විද්‍යාව පදනම් කරගෙන කරන්නා වූ විමසුමකට අවංක සිතින් අප හා එක්වන ලෙස ඉතා කාරුණිකව ඉල්ලා සිටින්නෙමු. මාංශ අනුභවය ඉස්ලාමයේ අනිවාර්ය කරුණක් නොවන අතර ඉස්ලාමීය වත්පිළිවෙත් හි සතුන් කැපීම පිළිබඳව ඇති කරුණු කෙරෙහි ද අපගේ අවධානය මෙම සාකච්ඡාවේදී යොමු කරමු.


### විශ්වීය බලපෑම

මෙම මාතෘකාව පිළිබඳව විශ්වීය දැක්මකින් යුක්තව සාකච්ඡාව ඇරඹීම වඩාත් උචිත යැයි අපි සිතන්නෙමු. එහෙයින් පළමුව නිර්මාංශ අනුභවය පමණක් ලෝක යථාර්ථයක් ද යන්න විමසා බලමු.

එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ ආහාර හා කෘෂිකර්මාන්ත සංවිධානයේ (Food and Agriculture Organization – FAO/UN) 2013 වර්ෂයේ සංඛ්‍යා ලේඛන අනුව වාර්ෂික ලෝක ඒක පුද්ගල මාංශ පරිභෝජනය (per capita consumption of meat) කි. ග්‍රෑ. 43.1 ක් වන අතර මත්ස්‍ය පරිභෝජනය කි.ග්‍රෑ. 19.7 ක් ලෙස දක්වා ඇත. බිලියන 7.181 (USCB) ක් වූ ලෝක ජනගහනයෙන් මෙම පරිභෝජන දත්තයන් වැඩි කිරීමෙන් 2013 වර්ෂය සඳහා වූ ලෝක මාංශ හා මත්ස්‍ය පරිභෝජන ප්‍රමාණයන් ලබාගත හැක.

| | | | | |
|---|---|---|---|---|
| ලෝක මාංශ පරිභෝජනය | = | 7.181X43.1 | = | කි.ග්‍රෑ.බිලියන 309.50 |
| ලෝක මත්ස්‍ය පරිභෝජනය | = | 7.181X19.7 | = | කි.ග්‍රෑ.බිලියන 141.47 |

# ලෝක මාංශ පාරිභෝජනය 2010-2012




මෙම දත්තයන් අපට හඬනගා කියන්නේ කුමක් ද? මෙවන් විශාල මාංශ හා මත්ස්‍ය පරිභෝජනයක් වෙනුවට කෘෂි නිෂ්පාදන ආදේශ කරන්නට යෑමෙන් සිදුවන අතුරු අනිසි විපාක පිළිබඳව බුද්ධිමත් යමෙකුට සිතා බලන්නටවත් හැකියාවක් තිබේ ද? සමස්තයක් වශයෙන් ලෝක යථාර්ථය දෙස බලන විට මාංශ හා මත්ස්‍ය අනුභවයෙන් තොර තත්ත්වයක් අපේක්ෂා කිරීම ප්‍රායෝගික නොවන බව අපට ඉහත දත්තයන් පැහැදිලි කරනවා නොවේ ද?




සත්ව ඝාතනයෙන් තොරව කෘෂි ගොවිතැනින් පමණක් ජීවත් වන්නට අප තීරණය කර ගත්තා යැයි මොහොතකට සිතමු. සත්ව ඝාතනයෙන් තොරව කෘෂි ගොවිතැන වුව ද කිරීමට අපට හැකියාව තිබේ ද? තම ගෙවත්තේ ඉතා සුළු පරිමාණයේ ගොවි තැනක් පළිබෝධ නාශක නොයොදා කිරීමට ඉඩකඩ සමහර විට තිබිය හැක. මෙසේ කිරීම ද අපගේ අත්දැකීම් අනුව සැමවිටම ප්‍රායෝගික නොවේ. නමුත් මහා පරිමාණ කෘෂි ගොවිතැන සඳහා අනිවාර්යයෙන්ම පළිබෝධ නාශක යොදා ගැනීමේ අවශ්‍යතාවය අපි දැක ඇත්තෙමු. ගොවිතැනට හානි කරන කෘමීන් ගොවියා විසින් හඳුනා ගැනීම පළමුව සිදුවේ. උන්ට ජීවයක් ඇති බව ගොවියා ඉතා හොඳින් දනී. උන්ගෙන් ගොවිතැනට සිදුවන හානිය අවබෝධ කරගන්නා ගොවියා උන්ව මරා දමන්නට චේතනාවක් ඇති කර ගනී. මේ සඳහා විවිධ උපක්‍රමයන් ගොවියා උපයෝගී කර ගනී. මෙම උපක්‍රමයන් මගින් කෘමීන් මරා දමා ඔහුගේ ගොවිතැන රැක ගන්නට ගොවියා ක්‍රියා කරයි. මෙයින් පැහැදිලි වන්නේ කුමක් ද? සත්ව ඝාතනයෙන් තොරව කෘෂි ගොවිතැන වුවද සාර්ථක අන්දමින් කර ගැනීමට අපට හැකියාවක් නොමැති බව නොවේ ද? මෙම ලෝක යථාර්ථය ප්‍රතික්ෂේප කළ හැක්කේ කවරෙකුට ද?

## දේශීය බලපෑම

අපි ශ්‍රී ලංකාව තුළ සත්ව ඝාතනයේ යථාර්ථය විමසා බලමු.

### දේශීය සමාජයීය බලපෑම

ශ්‍රී ලංකාව තුළ රජයෙන් අවසර පත් ලද ගවයින් කපන ස්ථාන 300 ක් පමණ ඇත.

මෙම අවසර පත් ලබා දෙන්නේ එම ප්‍රදේශය අයත් පළාත් පාලන ආයතනය මගිනි. මේ සඳහා ටෙන්ඩර් කැඳවීම තුළින් වැඩිම ටෙන්ඩරය ලබා ගන්නා තැනැත්තාගෙන් එම පළාත් පාලන ආයතනය විශාල මුදලක් අය කර ගනී. මෙම ගවයින් කපන අවසර පත් ලද ස්ථාන 300 මගින් දිනකට ගවයින් 5000ක් පමණ කපන බව සංඛ්‍යා ලේඛන අනුව දැන ගත හැක. මේ පිළිබඳව පශු සම්පත් අමාත්‍යංශය මගින් වැඩි දුර තොරතුරු ලබා ගත හැක. පෝය දින


12 අතහැර වර්ෂයකට සාමාන්‍ය වශයෙන් දින 350 කදී බලපත්‍ර ලබා ඇති ස්ථාන මගින් පමණක් කපන ගවයින් සංඛ්‍යාව පහතින් ඉදිරිපත් කොට ඇත්තෙමු.

**5000 X 350 = 1,750,000**

**'ගවයින් කැපීම නතර කළහොත් වර්ෂ හයකට වඩා අඩු කාලයක් ඇතුළත ජනගහනයට වඩා ගවගහනය වැඩි විය හැකි බව බුද්ධිය ඇති සැමට ඉතාම සරලව වටහා ගත හැකි සත්‍යයකි.'**

මෙය වර්ෂයක් තුළ බලපත්‍ර සහිතව කපන සංඛ්‍යාවය. බලපත්‍ර නොමැතිව ද නීතියට පටහැණිව ගවයින් කැපීම අප සැම දන්නා ප්‍රසිද්ධ රහසකි. මෙයට අමතරව දැනට ජීවතුන් අතර ඉන්නා ගවගහනයත් සැළකිල්ලට ගත් විට ගවයින් කැපීම නතර කළහොත් වර්ෂ හයකට වඩා අඩු කාලයක් ඇතුළත ජනගහනයට වඩා ගවගහනය වැඩි විය හැකි බව බුද්ධිය ඇති සැමට ඉතාම සරලව වටහා ගත හැකි සත්‍යයකි. මෙයින් සිදුවිය හැකි පාරිසරික අසමතුලිතතාවය ඉතාම භයානක ප්‍රතිඵල ගෙන දිය හැක්කක් බව ඕනෑම අයෙකුට පැහැදිළි වන කරුණකි. පැහැදිලි අවබෝධයකින් තොරව උද්ඝෝෂණයන් හි නිරත නොවී ලෝක යථාර්ථය අවබෝධ කරගෙන සුහදත්වයෙන් ජීවත් වන්නට අදිටන් කර ගනිමුයි කාරුණිකව ඉල්ලා සිටින්නට කැමැත්තෙමු.

ශ්‍රී ලංකාවේ මාංශ පරිභෝජනය පිළිබඳ යථාර්ථය මීළගට විමසා බලමු. ඉහත සංඛ්‍යා ලේඛන අනුව දිනකට කපන ගවයන් සංඛ්‍යාව 5000කි. එක් ගවයෙකුගෙන් සාමන්‍ය වශයෙන් මාංශ කි.ග්‍රෑම් 150ක් පමණ ලබා ගත හැක. මේ අනුව දිනකට අලෙවි වන මාංශ කි.ග්‍රෑම් ප්‍රමාණය 5000x150 = 750000 කි. **ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජනගහනය මිලියන 2ක් වන අතර මෙම කි.ග්‍රෑම් 750000 දෛනිකව මුස්ලිම් ජනයාට පමණක් පරිභෝජනය කළ හැක්කේ දැයි කරුණාකර සිතා බලන්න.** මාංශ අනුභවය කිසිවෙකු දෛනිකව සිදු නොකරයි. එයට අමතරව මුළු ජනගහනයම මාංශ අනුභවයේ දෛනිකව නොයෙදෙයි. මෙයින් පැහැදිලි වන්නේ කුමක් ද? සැබැවින්ම ගවමස් අනුභවය සිදු කරනු ලබන්නේ මුස්ලිම්වරුන් පමණක් නොවන බව මෙම සාධක හඬ නගා පවසනවා නොවේ ද?


PARLIAMENT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA

BUTCHERS (AMENDMENT) ACT, No. 13 OF 2008

[Certified on 29th February, 2008]

Printed on the Order of Government

Published as a Supplement to Part II of the Gazette of the Democratic Socialist Republic of Sri Lanka of February 29, 2008

Price : Rs. 4.00

Postage : Rs. 5.00

මස් වෙළඳුන් සඳහා වූ ගැසට් පනත

අප සියලු දෙනාම හොඳින් දන්නා පරිදි සන්නද්ධ හමුදා සෙබළුන්ගේ යහ

සෞඛ්‍යය හා කාර්ය සූරත්වය පවත්වාගෙන යෑම සඳහා මාංශ අනුභවය අත්‍යවශ්‍ය සාධකයකි. මේ සඳහා විකල්ප විසඳුමක් තිබේ ද?



සත්ව උද්‍යානයේ මාංශ භක්ෂක සතුන් සඳහා වූ ආහාර

ස්වභාවික පරිසරය තුළ ජීවත් වූ සතුන්, සත්ව උද්‍යානයකට ගෙනැවිත් උන්ගේ ජීවිත පරිසරය වෙනස් කළ විට මාංශ භක්ෂක සතුන් හට අප විසින් මාංශ සැපයිය යුතු නොවේ ද? මේ සඳහා ද විකල්ප විසඳුමක් තිබේ ද?

## දේශීය ආර්ථික බලපෑම


තවත් මූලික තර්කයක් වනුයේ හරක් මස් කර්මාන්තයක් නැතිව කිරි ආර්ථික වශයෙන් ලාභදායි කර්මාන්තයක් බවට පත් කළ හැකි ද යන ප්‍රශ්නයයි. ඕනෑම සත්ව පාලනයක දී මස් ප්‍රයෝජනයට නොගන්නේ නම් එම සත්ව පාලනය ආර්ථික වශයෙන් ඵලදායී විය නොහැකිය. එය පිළිගත් රීතියකි. මස් පිණිස නොගෙන බිත්තර සඳහා පමණක් කුකුලන් ඇති කිරීම ආර්ථික වශයෙන් ඵලදායී වන්නේ නැත. මස් ප්‍රයෝජනයට නොගෙන කිරි සඳහා පමණක් හරකුන් ඇති කිරීම ද ආර්ථික වශයෙන් ඵලදායී වන්නේ නැත.

කිරි වලින් රට ස්වයංපෝෂිත කිරීමට අවශ්‍ය නම් දිනකට ලීටර 20ත් 25ත් අතර ප්‍රමාණයකින් කිරි ලබාගත හැකි හොඳ වර්ගවල හරකුන්ගෙන් සමන්විත කිරිපට්ටි පාලනයකට රට යොමු කළ යුතුය. එක යායට පුරන් වී තිබෙන කුඹුරුවල ප්‍රමාණය සැලකිල්ලට ගත්විට ඒවා හරකුන්ට තණ නිපදවන තණ පිට්ටනි බවට පත්කළ හැකි නම් ඒවා ද ආර්ථික වශයෙන් ඵලදායී ඉඩම් බවට හැරවිය හැකිය. එහෙත් උසස් වර්ගයේ හරකුන්ගෙන් යුත් ගවපට්ටි පාලනයකට මිනිසුන් මුදල් ආයෝජනය කරනු ඇත්තේ, කරනු ලබන ආයෝජනයන්ට සරිලන ලාභයක් උපයාගත හැකි නම් පමණය. උසස් වර්ගයේ හරකුන් 100ක ගෙන් යුතු ගවපට්ටියක් කිසියම් කෙනෙකු ආරම්භ කළා යැයි උපකල්පනය කරමු. හොඳ වර්ගයේ එක හරකෙකු සඳහා ඔහුට රුපියල් ලක්ෂයක් දෙකක් අතර මුදලක් වැය කරන්නට සිදු වේ. හරකුන්ගේ වයස අවුරුදු තුනේ දී උන්ට පැටව් ලැබී කිරි ලබා ගත හැකි තත්ත්වයක් ඇති වේ. එහෙත් එම හරකුන්ගෙන් ඔහුට කිරි ලබාගත හැක්කේ අවුරුදු හතක් තරම් කාලයක් පමණය. ඉන් පසු කිරි ලබා ගත නොහැකි හෝ අඩුවෙන් කිරි ලබාදෙන ආර්ථික වශයෙන් ඵලදායී නොවන දෙනුන් බවට පත් වෙති. ඉන්

පසු ඒ හරක් 100ට ඔහු කරන්නේ කුමක්ද? ඔවුන් මැරෙන තුරු නඩත්තු කළ යුතු නොවේ ද? එසේ කළහොත් ඔහුගේ ගවපට්ටි පාලනය අලාභදායී එකක් බවට පත්වන්නේය. උසස් වර්ගයේ හරකෙකුගේ ජීව බර කිලෝ 500ක් ලෙස සැලකුවහොත් මස් පිණිස ජීව බරට දීමෙන් රුපියල් 100,000 ක් පමණ උපයා ගත හැකිය. එවිට සිය දෙනාගෙන් උපයා ගත හැකි ආදායම රුපියල් ලක්ෂ 100 කි. එම ලක්ෂ 100 ආදායමක් බවට හරවා නොගෙන ඔහුගේ කිරිපට්ටි කර්මාන්තය ලාභදායී තත්ත්වයක තබා ගත හැක්කේ කෙසේද? ඔහුට තම කර්මාන්තය ලාභදායී තත්ත්වයක තබා ගැනීමට අවශ්‍ය නම් එම හරක් 100 විකිණිය යුතුමය.

**රටේ ලාභදායී කිරි පට්ටි කර්මාන්තයක් පවත්වාගෙන යෑමට හැකිවනු ඇත්තේ කිරි ලබා ගත නොහැකි හා ප්‍රමාණවත් තරමකින් කිරි ලබාගත නොහැකි දෙනුන් මස් පිණිස විකිණීමට පුළුවන්කමක් ඇත්නම් පමණය.** එවැනි හරකුන්ට ඉල්ලුමක් තිබිය හැක්කේ රටේ හරක් මස් කර්මාන්තයක් තිබේ නම් පමණය. කිරි ගොවියා ආරක්ෂා කිරීමේ මෙම ප්‍රශ්නයට අර්ථවත් විකල්ප විසඳුමකින් තොරව පෙර සඳහන් කළ ගවයින් කපන ස්ථාන 300 වසා දැමීමට කටයුතු කිරීම බුද්ධිමත් ක්‍රියාවක් ද යන්න කරුණාකර සිතා බලන්න.

ඉන්දියාවේ හරක් මස් නොකන හින්දුන්ට ලාභදායී කිරිපට්ටි කර්මාන්තයක් පවත්වා ගෙන යෑමට හැකි වී තිබෙන්නේ හරක් මස් කන ජනතාවක් රටේ සිටින නිසාය. මසට හරක් මැරීම තහනම් කිරීමකින් විය හැක්කේ රටේ මුළු කිරිපට්ටි කර්මාන්තයම නැතිභංග කිරීමය.




**ඉන්දීය කිරි කර්මාන්තයේ හා හරක් මස් කර්මාන්තයේ ආදායම 2012-2013**

මෑතක සිට සංචාරක කර්මාන්තය වර්ධනය වීමෙන් විදේශ විනිමය ඉපැයීම, නව රැකියා අවස්ථා බිහිවීම හා විදේශ ආයෝජනය වැඩි වීම ආදී ආර්ථිකය ශක්තිමත් කරන කටයුතු සිදු වෙමින් පවතී. මෙම විදේශ සංචාරකයින්ට තරු පහේ හෝටල් හා අනෙකුත් භෝජනාගාර වලින් දිය හැක්කේ නිර්මාංශ ආහාර පමණක් යන ප්‍රවෘත්තිය ජාත්‍යන්තරව ප්‍රචාරය වුවහොත් සංචාරක කර්මාන්තයට සිදුවිය හැක්කේ කුමක්ද? විදේශ

සංචාරකයින්ගේ ජනප්‍රියතම හෝජ-නය Beef Steak නොහොත් තෙම්පරාදු කළ ගව මස් පෙත්ත බව නොදන්නෙක් නැති තරම්ය. ඔවුන්ට පමණක් දේශීය වශයෙන් හෝ ආනයනය කළ ගව මස් සපයන්නේ නම්, එය ගව මස් අනුභවය කැමති වූ දේශීය ජනයාගේ මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය කිරීමක් බවට පත් නොවන්නේද?

ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන මාංශ ආහාර පදනම් වූ විදේශීය අවන්හල්

ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් පෙත්සමක් මේ සම්බන්ධව ඉදිරිපත් වුවහොත් ඇති විය හැකි තත්ත්වය කුමක්ද? ගව මස් ආනයනය කළවිට අප නැවත වරක් දේශීය කිරි ගොවියාට ආර්ථික ප්‍රහාරයක් එල්ල කොට විදේශීය කිරි ගොවියා නගා සිටුවීමට කටයුතු කරනවා නොවේ ද?



ගව සමින් නිමැවෙන නිපැයුම්

සත්ව තෙල් විවිධ කර්මාන්තයන්ට උපයෝගී කර ගැනීමක් සිදු වේ. සත්ව ඝාතනයෙන් තොරව දේශීය සත්ව තෙල් සැපයුමට සිදුවන්නේ කුමක්ද? මේ සඳහා විකල්ප විසඳුමක් තිබේ ද?

සත්ව ඝාතනයෙන් තොරව සත්ව සමින් නිෂ්පාදිත පාවහන් කර්මාන්තයට පමණක් නොව අනෙකුත් සම් භාණ්ඩ කර්මාන්තයටද ඉතා විශාල හානියක් සිදු වීමට ඇති ඉඩකඩ ඉමහත්ය. මෙම කරුණ ද අප සැළකිල්ලට ගත යුතු නොවේ ද?

## පුද්ගල බලපෑම්

මෙම මාතෘකාව පිළිබඳව ඇති පුද්ගල බලපෑම් කෙරෙහි ද අවධානය යොමු කරමු.

### සෞඛ්‍ය බලපෑම්

අප රට විවිධ වසංගත රෝගයන්ට මුහුණ පා ඇත. 19 වන සියවස ආරම්භයේ ඇතිවූ මැලේරියා වසංගතයෙන් ජනගහනයෙන් කොටසක්

මියගිය අතර රටවැසියන් මේ හේතුවෙන් ඉතා දුෂ්කර තත්වයකට පත්වූහ. දැනට අප මුහුණපාමින් සිටින්නේ තවත් වසංගත රෝග රැල්ලකටය. ඩෙංගු හා බරවා වැනි වසංගත රෝග මුළු රටටම ඉතා විශාල අභියෝගයක් බවට පත්ව ඇත. ඩෙංගු වසංගතයෙන් මිය යන සංඛ්‍යාව දිනපතා පුවත්පත් මගින් කියවනවිට අප පත්වන්නේ ඉතාමත් කම්පනීය තත්ත්වයකටය. මෙම වසංගත රෝග බෝ කරන විෂබීජ මිනිසාගේ ශරීරයට ඇතුලත් වන්නේ මදුරුවන් මාර්ගයෙනි. මෙම රෝගකාරක විෂබීජ ශරීරගත කරන මදුරුවන් මරා දමන්නට රාජ්‍ය අනුග්‍රහය ඇතිව විවිධ වැඩ සටහන් රටේ ක්‍රියාත්මක වෙමින් පවතී.



රාජ්‍ය අනුග්‍රහය යටතේ මර්දනය වන ඩෙංගු මදුරු උවදුර

මෙම මදුරුවන් මරාදමන්නට අප ඉදිරිපත් නොවුනානම් සිදුවන විනාශකාරී තත්වය යමෙකුට සිතාබලන්නට බැරි තරම් බරපතල හා භයානක එකක් බව අමුතුවෙන් කිවයුතු වන්නේ නැත. මෙයිනුදු සනාථවන ලෝක යථාර්ථය කුමක්ද? මේ සඳහා විකල්ප විසඳුමක් තිබේ ද?

නියුමෝනියාව, ක්ෂය රෝගය වැනි ආසාධනයන් ඇතිවූ විට අපට ප්‍රති ජීවක (Antibiotic) බෙහෙත් ගැනීමට අනිවාර්යයෙන්ම සිදුවන්නේය. මෙම ප්‍රති ජීවක බෙහෙත් මගින් සිදු වන්නේ ශරීර ගත වී ඇති කෝටි ගණන් රෝගකාරක විෂබීජ නසා දමා අපට දිවි රැක ගැනීමට උපකාරී වීමක් නොවේ ද?

මිනිසාට ඇත්තේ සර්ව භක්ෂක දත් පෙළකි. කෘෂි ආහාර අනුභවයට සුදුසු කෘන්තක දත් මෙන්ම මාංශ අනුභවයට උපකාරීවන රදනක දත් ද

**ඔබ මේ ගැන සිතුවාද?** ස්වභාවයෙන්ම මිනිසාට සර්ව භක්ෂක දත් පෙළක් පිහිටා තිබීම මිනිසා උපතින්ම සර්ව භක්ෂකයෙකු ලෙස කියා නොපාන්නේද?



මිනිසාට තිබේ. ජීරණ පද්ධතිය ද මිනිසාගේ සකස්වී ඇත්තේ කෘෂි මෙන්ම මාංශ ආහාර ජීරණය කළහැකි වන අයුරිනි. මෙයිනුත් පෙනී යන්නේ ස්වභාවයෙන්ම මිනිසා සර්ව භක්ෂක සතෙක් බව නොවේද? එනම් මාංශ අනුභවය හැර වෙනත් විකල්පයක් නොමැති එස්කිමෝ වැනි ජන කොටස් වලට මාංශ අනුභවය කල හැකි පරිදි මිනිසාගේ දත් නිර්මාණය වී නොතිබුනා නම් ඔවුන් පත්විය හැකි තත්වය කරුණාකර සිතා බලන්න.

මිනිසාගේ යහපත පිණිස විවිධ පර්යේෂණ වල යෙදෙමින් වෛද්‍ය විද්‍යාව උදාර ඉදිරි ගමනක යෙදී සිටියි. මෙම වෛද්‍ය පර්යේෂණ සඳහා සතුන් රාශියකගේ ජීවිත පරිත්‍යාග සිදුවී හා සිදුවෙමින් පවතී. පරාණ ඝාතනය සම්පූර්ණයෙන්ම වැරදියි යන මතයේ අප එල්බ ගෙන සිටියේ නම් වෛද්‍ය විද්‍යාව අදත් ප්‍රාග් ඓතිහාසික තත්වයෙන් ඉදිරියට ගමන් කළ නොහැකි තත්ත්වයේ අනිවාර්යයෙන්ම රැඳී සිටිනු ඇත.

## පොදු සාධක



සත්ව ඝාතනය පිළිබඳව අප සාකච්ඡා කිරීමේදී බොහෝ විට එයට විරුද්ධව අදහස් දක්වන්නන් කතා කරනුයේ ගවයින් කැපීමට එරෙහිවය. මෙයට හේතුව බොහෝ විට ශ්‍රී ලාංකික සංස්කෘතිය සමග ගවයා පිළිබඳව ඇති සම්බන්ධතාව විය හැක. කුඹුරු ගොවිතැන, ප්‍රවාහන කටයුතු සහ විශේෂයෙන්ම කිරි ලබා ගැනීමේ ප්‍රධාන මගක් ලෙස පාරම්පරිකව උපකාරී වූ මෙම සතා ගැන බැඳීමක් ඇති වීම ද එක් අතකින් සත්‍යයකි. බෙරයද ජාතික සංස්කෘතියේ කොටසකි. එයට සම් ලබාගන්නා එක් මගක් ලෙස ද ගවයා දක්විය හැක.



එස්කිමෝවරු දඩයමේ යෙදෙන සිතුවමක්

මේවා හැරෙන්නට වෙනත් ආගමික හෝ සංස්කෘතික හේතුවක් නිසා මෙම මතය ගොඩනැගී ඇති බව කීමට කිසිම සාක්ෂියක් හෝ සාධකයක් නොමැත. ඒ අතරම මත්ස්‍ය හා අනෙකුත් මාංශ පිළිබඳව ඇති නිහැඬියාවද සැබැවින්ම මවිතකරය.


ජලය හිම කටුක කාන්තාරයේ ජීවත්වන්නාට හා වසරේ දින 365 ම හිම

මත ජීවත්වන්නා වූ එස්කිමෝ වරුන්ට මාංශ අනුභවයෙන් වැළකෙන ලෙස දේශනා කරන්නට අපට සදාචාරාත්මක අයිතියක් තිබේද? නිර්මාංශ ආහාර ප්‍රතිපත්තිය ඔවුන්ට කෙසේ නම් වලංගු විය හැකිද?

## ආගමික දැක්ම

ඉන්දියාව හින්දු භක්තිකයින් බහුතරයක් ජීවත්වන විශාලතම රටය. හින්දු දහමේ ගවයාට දේවත්වයට සමීප තත්ත්වයක් ලබා දී ඇත. එහෙත් ඉන්දියාවේ ගවයින් කැපීම බොහෝ ප්‍රදේශයන්හි සිදුවෙමින් පවතී. ජෛන දහම හැර ලොව අන් කිසිම දහමක් මාංශ අනුභවය තහනම් කොට නොමැති බව සඳහන් කරන්නට කැමැත්තෙමු.

**ඉන්දීය මාංශ පරිභෝජනය 2005-2006**




අප ජීවත් වන්නේ බහු වාර්ගික හා බහු ආගමික සමාජයකය. මෙම සමාජ ස්තරයන්ට ආවේනික වූ චර්යාවන් හා ක්‍රියාකාරකම් ඇත. උදාහරණයක් ලෙස ගත් විට ඉස්ලාමිකයින් ඌරු මස් අනුභව නොකරති. එහෙත් කිතුනුවන්ගෙන් බහුතරයක් හා බෞද්ධයින්ගෙන් සුළුතරයක් ඌරු මස් අනුභව කරන්නන්ව සිටිති. බහු ආගමික සමාජයක ඉස්ලාමිකයින්ගේ චර්යාවට මෙය පටහැනි බව පවසා ඌරු මස් අනුභවය තහනම් කරන ලෙස ඉල්ලීමට සදාචාරාත්මක අයිතියක් ඉස්ලාමිකයින්ට තිබේ ද? බහු ජනවාර්ගික හා බහු ආගමික සමාජයක එක් එක් සමාජ ස්තරයන්ගේ චර්යාවන් හා වත්පිළිවෙත් අනිකා කෙරෙහි නීතියෙන් හෝ බලයෙන් පැටවීමට සදාචාරාත්මක අයිතියක් කිසිවෙකුට තිබේ ද? ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වැනි පරිච්ඡේදයේ මූලික

අයිතිවාසිකම් පිළිබඳ කොටසේ 10 හා 14 (1) වැනි වගන්තීන් හි පහත සඳහන් අයුරින් සටහන් කොට ඇත.

**3-10 "සෑම තැනැත්තෙකුටම තමන් අභිමත ආගමක් ඇදහීමේ හෝ වැළඳ ගැනීමේ නිදහස ද, ලබ්ධියක් හෝ විශ්වාසයක් දැරීමේ හෝ පිළිගැනීමේ නිදහස ද ඇතුළුව සිතීමේ නිදහසට, හෘදය සාක්ෂියේ නිදහසට සහ ආගමික නිදහසට හිමිකම් ඇත්තේ ය."**

**3-14 (1) "සෑම පුරවැසියකුටම - (ඉ) එකලාව හෝ අන් අය හා සමග, ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව තම ආගම, ලබ්ධිය හෝ විශ්වාසය ඇදහීමෙන්, පිළිපැදීමෙන්, ප්‍රගුණ කිරීමෙන් සහ ඉගැන්වීමෙන් ප්‍රකාශ කිරීමේ නිදහසටත් (ඊ) එකලාව හෝ අන් අය හා සමග හෝ ස්වකීය සංස්කෘතිය භුක්ති විඳීමේ හා වැඩි දියුණු කිරීමේ නිදහසට සහ ස්වකීය භාෂාව භාවිත කිරීමේ නිදහසටත් හිමිකම ඇත්තේ ය."**

## බිලි පූජාව

බිලි පූජාව ආරම්භ වුයේ හලාවත මුන්නේශ්වරම් කෝවිලෙන් නොවන බව අප සැවොම දන්නා කරුණකි. බුදු දහම බිහි වූ යුගයේ භාරත දේශයේ පැවතියේ බහු ආගමික හා බහු ජනවාර්ගික සමාජයකි. විවිධ ආගමික ඇදහිලි හා විශ්වාස එහි විය. ඒ අවස්ථාව වන විට භාරත දේශයේ මහා පරිමාණ ලෙස ව්‍යාප්ත වී තිබුණේ බ්‍රාහ්මණ දහමයි. ඒ අතර විවිධ ආගමික දෘෂ්ටි ගරු කළ ශ්‍රමණ කණ්ඩායම්, ආජීවකයන්, පරිබ්‍රාජකයන්, ජටිලයන්, සහ වෙනත් තාපස යෝගී නිකායයන් එහි ක්‍රියාත්මක විය. මේ අතර ෂඩ් ශාස්ත්‍ර දර්ශනයන්ද විය. මේ හැම ආගමික සම්ප්‍රදායක්ම විවිධ මතිමතාන්තර ඉදිරිපත් කළහ. දීඝ නිකායේ බ්‍රහ්මජාල සූත්‍රයෙහි සඳහන් පරිදි බුද්ධ කාලීන භාරත දේශයේ දෘෂ්ටීන් දෙසැටක් ව්‍යාප්ත වී පැවත ඇත. බුදුන් වහන්සේ අන්‍යාගමික පැවිද්දන් හා ඔවුන්ගේ ඉගැන්වීම් හෙළා දැකීමට ඉදිරිපත් වූ බවක් පිළිබඳව කිසිම සඳහනක් පිටකයන් හි නොමැත. බුදුන් දවස බ්‍රාහ්මණ දහම අනුගමනය කළවුන් අතර අද මෙන්ම බිලි පුජා පැවති බවට සාක්ෂි බොහෝමයක් ඇත.


ඉපැරණි බිලි පූජාව දැක්වෙන මූර්තියක්

යාග හෝම සම්බන්ධයෙන් කරන්නා වූ මෙම ක්‍රියාව අර්ථ විරහිත කෘෘර හිංසාකාරී ක්‍රියාවක් බව පවසමින් බුදුන් වහන්සේ දේශනා කළා මිස එය

නැවැත් වීමට රාජ්‍ය බලය යෙදවීම, විරෝධතා උද්ඝෝෂණ පැවැත්වීම වැනි ක්‍රියා උන්වහන්සේ හෝ උන්වහන්සේගේ ශ්‍රාවකයන් විසින් නොකරන ලදී. **එම ක්‍රියාවන් සම්බන්ධයෙන් බුදුන් වහන්සේ ක්‍රියා කළ ආකාරය ප්‍රශංසනීයය, ප්‍රජාතන්ත්‍රවාදීය. තවද කරුණාව මෛත්‍රිය පදනම් කරගත් ශ්‍රේෂ්ඨ නායකයෙකුගේ බුද්ධිමය ප්‍රතිචාරය මෙය යැයි ලොවට ඔප්පු කරන්නා වූ හැසිරීමකි එය.**

## අන්තවාදිත්වයෙන් තොර බුදුන් වහන්සේගේ මධ්‍යස්ථ ක්‍රියා කලාපය

බී. බී. සී. ආයතනය අන්තවාදය විග්‍රහ කොට ඇත්තේ පහත සඳහන් අයුරිනි.

**"බ්‍රිතාන්‍ය රජය අන්තවාදය නිර්වචනය කොට ඇත්තේ 'ප්‍රජාතන්ත්‍රවාදය, නීතියේ ආධිපත්‍යය, පුද්ගලික නිදහස, විවිධ ආගමික විශ්වාසයන් හා භක්තීන් පිළිබඳව අන්‍යෝන්‍ය ගරුත්වය හා රිස්සුම වැනි මූලික බ්‍රිතාන්‍ය අගයන්ට එරෙහිව වාචිකව හා ක්‍රියාකාරී අයුරින් කටයුතු කිරීම''** වශයෙනි.

'අන්තවාදය' පිළිබඳව මෙයට වෙනස් වූ මතයක් ඇත්නම් එය සලකා බලන්නට කැමැත්තෙමු.

මාංශ අනුභවය හෝ ආගමික පිළිවෙත් සඳහා සතුන් කැපීම අන්තවාදී ක්‍රියාවක් ලෙස අර්ථ දක්වන්නට උත්සාහ කරන්නන් කරුණාකර අන්තවාදය පිළිබඳව ඉහත අර්ථ දැක්වීම හා බිළි පූජා ගැන බුදුන් වහන්සේගේ මධ්‍යස්ථ ක්‍රියා කලාපය දෙස අවධානය යොමු කරත්වා.

## ඉස්ලාමීය ඉගැන්වීම්

ඉස්ලාමය මාංශ අනුභවය අනුමත කළ ද සතුන් පිළිබඳව කටයුතු කිරීමේදී උපදෙස් රාශියක් ඉදිරිපත් කොට ඇත. **ගිනියම් වූ යකඩයක් උපයෝගී කරගෙන කරන්නාවූ හංවඩු ගැසීමේ ක්‍රියාව සහමුලින්ම තහනම් ය.** ඉස්ලාමීය පිළිවෙත අනුව සතුන් කැපීමේ දී සිදුවන අවම වේදනාවට වඩා දසදහස් වාරයක වේදනාවක් ගෙනදෙන කෲර ක්‍රියාවක් ලෙස මෙය ඉස්ලාමය හඳුන්වයි. මෙයට අමතරව **උපත් පාලනය සඳහා වූ කර ඇඹීම හා වෙනත් උපත් පාලන ක්‍රම, සත්ව පොර පැවැත්වීම, විනෝදය සඳහා සත්වයින් ඉලක්ක ලෙස තබා විදීම හා වෙඩි තැබීම, සතුන්ට නිසි අයුරින් අහාර පාන ලබා නොදී**

**සිර කර තැබීම, සතුන්ට අනිසි ලෙස පහර දීම, දැරිය නොහැකි බර පැටවීම, නිකරුණේ හෝ හිංසා සහගතව සතුන් පිට අසුන් ගැනීම, මවගෙන් පැටියා වෙන් කිරීම වැනි ක්‍රියාවන් ඉස්ලාමය සම්පූර්ණයෙන් ම තහනම් කොට ඇත.**

**අල් කුර්ආන් 5:3 වැකියේ සඳහන් කරුණු අනුව පහත සඳහන් ක්‍රමවලට අනුව සතුන් මරා අනුභව කිරීම තහනම්ය.**

1. ගෙල මිරිකා මරණ ලද සතුන් ද
2. පහර දී මරණ ලද සතුන් ද
3. පහළට වැටී මරණයට පත් සතුන් ද
4. ඇණීමෙන් මරණයට පත් සතුන් ද

මේ අනුව අපට ආහාරය සඳහා අනුමැතිය ලබා දී ඇත්තේ ඉස්ලාමීය පිළිවෙත අනුව කපනු ලැබූ අනුමත සතුන්ගේ මාංශ පමණි. ඉහත අල් කුර්ආන වැකියේ සඳහන් අනෙකුත් සියලුම ක්‍රමයන් සත්ව හිංසනයට හේතුවන බව ඔබට පැහැදිලිවනු ඇතැයි විශ්වාස කරන්නෙමු. විසිඑක් වන සියවසේ සතුන් කැපීම පිළිබඳව අප රටේ ඇති නීතිරීති හා ශත වර්ෂ දාහතරකට පෙර ඉස්ලාමය පැනවූ පිළිවෙත් අතරේ සමතාවක් ඇති බව ඔබට පෙනී යනු නිසැකය.

## හජ් උත්සවය හා ඉස්ලාමීය වත් පිළිවෙත්

සතෙකු කපා අසරණ හා දුගී ජනයාට මෙන්ම අසල්වැසි හා හිතවතුන්ට ඉස්ලාමීය දින දර්ශනයේ 12 වැනි මස 10 සිට 13 වැනි දින දක්වා දානයක් ලෙස පිරිනැමීම ඉස්ලාමීය වත්පිළිවෙත් හි 'උල්හියියා' නමින් හැඳින් වේ. මෙය අල්තාරයක් හෝ පිළිරුවක් ඉදිරියේ කරන්නා වූ බිලි පූජාවක් හෝ බිලි දීමක් නොවේ. ඉතාමත් පිරිසිදු චේතනාවෙන් පෙර පැවසුවාක් මෙන් දුගීන්ට, අසරණයින්ට, යාචකයින්ට, අසල්වැසියන්ට හා නෑ හිතවතුන්ට ආහාරය පිණිස කරන්නා වූ දානමය ක්‍රියාවකි.

> **'ඉහත සඳහන් කළාක් මෙන් දෛනිකව කපනු ලබන ගවයින් 5000 සමග සැසඳීමේදී මෙම දින හතර තුළ කපනු ලබන්නේ ඉන් අල්පයක් බව අවධාරණයෙන් පැවසිය යුතුව ඇත.'**

ඉහත සඳහන් කළාක් මෙන් දෛනිකව කපනු ලබන ගවයින් 5000 සමග සැසඳීමේදී මෙම දින හතර තුළ කපනු ලබන්නේ ඉන් අල්පයක් බව අවධාරණයෙන් පැවසිය යුතුව ඇත.

සත්ව ඝාතනය හා මාංශ අනුභවය තහනම් කිරීම පිළිබඳව මෙතෙක් අප සාකච්ඡා කළ ආර්ථික සමාජයීය හා සෞඛ්‍යය සම්බන්ධයෙන් වූ ප්‍රශ්නවලට විසඳුම් ලබා ගැනීමෙන් පසුව මෙයට අදාළ ආගමික වත් පිළිවෙත් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමම මැදුම් පිළිවෙතක් ලෙස සැලකිය හැක.

බහු වාර්ගික හා බහු ආගමික සමාජයක එකිනෙකාගේ විශ්වාසයන් හා මතයන්ට ගරු කරමින් තමාට යහ යැයි අවබෝධ වන විශ්වාසයෙහි හා මතයෙහි පිහිටා ක්‍රියා කිරීමට ඇති නිදහස හා අයිතිය අත්‍යවශ්‍ය කරුණකි. අනවබෝධය හේතුවෙන් අප අන් අයගේ විශ්වාසයන් හා ක්‍රියාකාරකම් කෙරෙහි බලපෑම් කරන්නට හෝ විවේචනය කරන්නට හෝ යෑමෙන් සිදු වන්නේ කාලාන්තරයක් තිස්සේ පැවත ආ සුහදත්වය පළුදු වී එකිනෙකාගෙන් ඈත් වූ සමාජයක් ඇති වීමය. මෙය රටේ ආර්ථික හා සමාජයීය සංවර්ධනයට හිතකර පරිසරයක් ලෙස කිසිසේත්ම සැලකිය නොහැක. අනවබෝධය හා ඉන් මතු වන අනර්ථකාරී වෛරය ඉවත් කොට සැමට සතුටින් එකට ජීවත් විය හැකි, සුහදත්වය හා මිනිසත්කම පදනම් කර ගත් සමාජයක් ගොඩ නැගීමට අධිෂ්ඨානශීලීව එකට අත්වැල් බැඳ ගනිමු.



අන්‍යෝන්‍ය අවබෝධ ගොඩ නැඟීම පදනම් කර ගෙන මෙම 'සමාජ සංවාද' ලිපි පෙළෙන් අප අපේක්ෂා කරන්නේ ශ්‍රී ලාංකේය සැමට සුහදත්වය, සාමය හා සහෝදරත්වයෙන් සපිරි අලංකාර සමාජ පරිසරයක් ගොඩ නැඟීමයි.

එනිසා අපි සත්‍යය අවබෝධ කර ගනිමු. දැනුවත් වෙමු, වෛරය, ක්‍රෝධය තුරන් කරමු. සාමකාමී, හා සමගියෙන් බැඳුනු මව්බිමක් ගොඩනගමු. ඉදිරි පරපුරට සාමකාමී හා සෞභාග්‍යයෙන් යුත් රටක් ගොඩ නගන්නට අවශ්‍ය අඩිතාලම දමන්නට අදම අධිෂ්ඨාන කර ගනිමු.